# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.සේනානායක පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk

මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/218/19 ඔබේ අංකය :

2019.11.01

සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා,
ගරු වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>මැතිවරණ රාජකාරී යෙදවීමේදී ඡන්දපොල භාර කාන්තා නිලධාරීන්ගේ (SPO) පුද්ගලික ආරක්ෂක නිලධාරීන් ලෙස පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ කාන්තා නිලධාරිණියන් රාජකාරී යෙදවීම සම්බන්ධව.</u>**

01. මැතිවරණ විශේෂ රාජකාරී සඳහා යොදවනු ලබන පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ කාන්තා නිලධාරිණියන් ඡන්ද පොල භාරව කටයුතු කරනු ලබන කාන්තා නිලධාරිණියන්ගේ (SPO) පුද්ගලික ආරක්ෂක රාජකාරී (PSO) සඳහා පසුගිය මැතිවරණයේදී යොදවා ඇති බවත්, ඒ මගින් පරීක්ෂක ශ්‍රේණියේ කාන්තා නිලධාරිණියන් පත්වන අපහසුතාවයන් පිළිබඳව කරුණු ඇතුලත් අභියාචනයක් පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය වෙත ඉදිරිපත් කර ඇත.

    මෙහිදී ඡන්ද පොල භාර නිලධාරී (SPO) වශයෙන් කටයුතු කරනු ලබන්නේ රාජ්‍ය කළමණාකාර සහකාර i වන ශ්‍රේණියේ නිලධාරීන් වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව උප පොලිස් පරීක්ෂක වරුන් සහ කළමණාකාර සහකාර වරුන් ද්විතීය මට්ටමේ සම තනතුරු වේ. එබැවින් එම නිලධාරීන්ගේ පුද්ගලික ආරක්ෂක රාජකාරී වශයෙන් පරීක්ෂක ශ්‍රේණියේ කාන්තා නිලධාරිණියන් යෙදවීම මගින් තනතුර හෑල්ලුවට ලක්වීම තුලින් අපහසුතාවයන්ට ලක්වේ. එබැවින් ඉදිරියේදී පැවැත්වෙන මැතිවරණ විශේෂ රාජකාරී යොදවන කාන්තා පොලිස් පරීක්ෂක නිලධාරිණියන්ගේ වෘත්තියේ ගරුත්වය ආරක්ෂාවන පරිදි රාජකාරී යෙදවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.
ගරු ලේකම්
පොලිස් පරීක්ෂක සංගමය

අභිමානවත් පොලිසියක් ගොඩනගමු.